www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ස්ක්‍රිපාල්ට විෂ වැද්දීම හා රුසියාවට එරෙහි උද්ඝෝෂනය

The poisoning of Skripal and the campaign against Russia

**2018 මාර්තු 28**

සඳුදා වොෂින්ටනය රුසියානු රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් 60දෙනෙකු නෙරපීම, හා එකිනෙකා රුසියානු රාජ්‍යතාන්ත්‍රිකයින් අතලොස්සක් සාපේක්ෂකව නෙරපීම නියෝග කරන, බ්‍රිතාන්‍ය, ප්‍රන්සය, ජර්මනිය, හා වෙනත් රටවල් 20ක සමායෝජිත පියවර රුසියාවට එරෙහි නැටෝ බලවතුන්ගේ කුරිරු උද්ඝෝෂණය ප්‍රකෝපකාරීව උත්සන්න කිරීමකි.

මෙම ක්‍රියාව සඳහා ප්‍රකාශිත කඩතුරාව වන්නේ මාර්තු 4වැනිදා බ්‍රිතාන්‍ය නගරයක් වන සැලිස්බරියේ උද්‍යාන බංකුවක් මත දී හිටපු රුසියානු ඔත්තුකරුවෙකු මෙන් බ්‍රිතාන්‍ය ද්විත්ව ඒජන්තයෙකු ද වන සර්ගෙයි ස්ක්‍රිපාල් හා ඔහුගේ වැඩිහිටි දුවට විෂ වැද්දීම යි.

ටෝරි අගමැතිනී තෙරේසා මේ ගේ ආන්ඩුව පසු ගිය සති දෙක තිස්සේ යලි යලිත් පවසා ඇත්තේ, අසාධ්‍ය තත්වයෙන් ස්ක්‍රිපාල් හා දියනිය රෝහල් ගත කෙරුනු ප්‍රහාරය පිටුපස මොස්කව් සිටි බව "බොහෝ සේ විය හැකි" බව යි. බ්‍රිතාන්‍ය විදේශ ඇමති බොරිස් ජොන්සන් ඊටත් වඩාත් දුර ගොස් ඇත්තේ, රුසියානු ජනාධිපති ඇඩොල්ෆ් හිට්ලර්ට සමාන කිරීමට තරම් දුර යමින්, ව්ලැඩිමීර් පුටින් පුද්ගලිකව ම ප්‍රහාරය නියෝග කල බව "ඉතා ප්‍රබල ලෙස විය හැකි" යැයි පවසමිනි.

මෙම චෝදනාවට සහාය දිය හැකි සාධාරන කරුනු දෙකක් දක්නට නොමැත: 1) සත්‍යෙක්ෂණය කල හැකි මොන යම් හෝ සාක්ෂියක්, 2) රුසියානු ආන්ඩුව එවැනි ප්‍රහාරයක් ගෙන යාම සඳහා හේතු වූ මොන යම් හෝ සත්‍යරූපී අභිප්‍රායක්.

රාජ්‍යතාන්ත්‍රිකයින් නෙරපීමේ දී වොෂින්ටනය සමග එක් වූ රටවල් කීපයක් අවංකව පිලි ගන්නේ ඔවුන්ට කුමන හෝ සාක්ෂියක් පෙන්වා නැති බව යි. බොහෝ අවස්ථාවල දී, මෙම රටවල් එකත් හතරත් අතර සංඛ්‍යාවක රුසියානුවන්ට රටින් පිටවීමට නියෝග කර ඇති අතර, රුසියාව මෙය වාර්තා කර ඇත්තේ නිශ්ශබ්ද සමාව ඉල්ලීමක් ලෙස ය.

තමන්ගේ පැත්තෙන්, බ්‍රිතාන්‍ය ආන්ඩුව විෂ වැද්දීම පිලිබඳ සැබෑ අපරාධකාරයා සොයා ගැනීමට යැයි කියන ලද තම පරීක්ෂනයට ගත කලේ, සිරිත් පරිදි සාමාන්‍ය විදි අපරාධයකට ගත විය හැකි කාලයට වඩා අඩු කාලයකි.

කිසිදු සාක්ෂියකින් සහාය නො ලබන, බ්‍රිතාන්‍ය හා එක්සත් ජනපදය විසින් කෙරුනු චෝදනා සැබවින් ම කුමන්ත්‍රනය කෙරුනේ රුසියානු විරෝධී උද්ඝෝෂනය සඳහා දේශපාලනික නීත්‍යානුකූල බවක් ලබා දීමට ය. ඔහුගේ අවසාන නිල කාලය සඳහා පුටින් නැවත පත් කර ගැනීමේ සන්ධ්‍යාවේ දී ම (රුසියානු ආන්ඩුව විසින් ඉහතදී අත්අඩංගුවට ගෙන පසුව මුදා හල) සක්‍රිපාල් ගේ ඝාතනය කිරීමට තැත් කිරීමට තරම් රුසියානු ආන්ඩුවට තේරුම් ගත හැකි අභිප්‍රායක් නොමැත.

ඕනෑ ම පොලිස් පරීක්ෂකයෙකුගෙන් යමෙකු මූලික ප්‍රශ්නය එනම් මෙම අපරාධය ක්‍රියාත්මක කිරීමේ අභිප්‍රාය තිබුනේ කාට ද? යන්න අසන්නේ නම්, නිසැක උත්තරය වනු ඇත්තේ එක්සත් ජනපදය, හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් වන බව යි. ඔවුන් සිද්ධිය යොදා ගෙන ඇත්තේ කලින් තීරනය කෙරී තිබුන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා කඩතුරාවක් සැපයීමට ය.

සැලිස්බරියේ විෂ වැද්දීම පිලිබඳ වඩාත් විශ්වාසවන්ත පැහැදිලි කිරීම වන්නේ, ප්‍රහාරයට ලක්වූ, ද්විත්ව ඒජන්ත ස්ක්‍රිපාල් මහතා හා ඔහුගේ දුව බොහෝ නිශ්චිත භූමිලෝපායික අරමුනු ඉදිරියට ගෙන යාමට එක්සත් ජනපද හා බ්‍රිතාන්‍ය ඔත්තු සේවා ඒජන්සි විසින් පිලියෙල කෙරුනු කුමන්ත්‍රනය සඳහා හුදෙක් යොදවා ගනු ලැබූ ඉත්තන් වන බව යි.

එහෙත්, තම භූමිලෝපායික අරමුනේ උත්සුකයන් තුල දී ක්‍රෙම්ලින් තන්ත්‍රයට එරෙහිව යුද ප්‍රචාරය උත්සන්න කරනු පිනිස සැක නො කෙරෙන පුද්ගලයන් දෙදෙනෙකු ඝාතනය කිරීමට තරම් දුර ඇමරිකානු සීඅයිඒ සංවිධානය හා එම්අයි6 යනු ඇතැ යි යන්න සැබවින් ම විය හැකි ද?

මෙම ප්‍රකෝපකරනය වේදිකා ගත කරමින් සිටින අය අයත් වන්නේ ඉරාක ආක්‍රමනය යුක්තිසහගත කිරීමට "ජන ඝාතක අවි" හඳුන්වා දුන් අධිරාජ්‍යවාදී අපරාධකරුවන්ගේ එකම කල්ලියට යි. ඔබාමා පාලනාධිකාරියේ සිට ලෝකය පුරා අඛන්ඩ ඝාතන සඳහා සීඅයිඒ සංවිධානය අනුබද්ධ කෙරී ඇත්තේ ඔවුන්ගේ අභිමත ආයුධය ලෙස ඩ්‍රෝන් මිසයිල් යොදා ගනිමිනි. මිනීමරු සමායතනය යන අපර නාමය දිනා ගත් ඒජන්සියේ අවසානයක් නැති අපරාධවල මැත ම අංගය මෙය යි. එමෙන් ම ට්‍රම්ප් පාලනාධිකාරිය මේ මොහොතේ ප්‍රසිද්ධ රහස් වද බිම් හිංසිකාවක සීඅයිඒ ප්‍රධානියා ලෙස පත් කර ඇත.

ස්ක්‍රිපාල් හා ඔහුගේ දුවගේ ඝාතන ප්‍රයත්නය සංවිධානය කිරීම හා ඊට පසු අපරාධය මොස්කව් මත ඇමිනීම නිශ්චිත දේශපාලන අරුමුනු වෙනුවෙන් සේවය කර යි.

2008දී කැඩී ගිය දකුනු ඔසෙටියා හා අබ්කාෂියා ප්‍රාන්ත යලි අත්පත් කර ගැනීමට එක්සත් ජනපදය අනුබල දුන් ජෝර්ජියානු යුද්ධය අසාර්ථක වීමේ තැන් සිට, ගෙවී ගිය දශක කීපය මුලුල්ලේ, එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන් ගෝලීය ආධිපත්‍යය සඳහා වන තම ගමනේ නොඉවසිය හැකි බාධකයක් ලෙස දකින, රුසියාවට එරෙහිව වොෂින්ටනය තම ආක්‍රමනය හා ප්‍රචාරය නොනැවත උත්සන්න කර ඇත.

තම කලු මුහුදු නාවික බල ඇනියේ කඳවුර ලෙස සේවය කරන්නාවූ ද ප්‍රමුඛ වශයෙන් රුසියානු භූමි භාගයක් වන්නා වූ ද, ක්‍රිමියාව ඈඳා ගැනීමට රුසියාව පෙලඹ වූ, එක්සත් ජනපද අනුග්‍රහ ලැබ ෆැසිස්ට්වාදීන් නායකත්වය දුන්, 2014 යුක්‍රේන කුමන්ත්‍රනයේ සිට ආතතීන් ඉහල ගොස් ඇතිවා පමනි.

අවසාන වශයෙන්, ජනාධිපති බෂාර් අල්-අසාද්ගේ ආන්ඩුවට රුසියාව (හා ඉරානය) දෙන සහාය, සිරියාවේ තන්ත්‍ර වෙනස සඳහා සීඅයිඒ අනුග්‍රහ දක්වන හත් වසරක යුද්ධය දුෂ්කර කර ඇත්තේ, එක්සත් ජනපද හමුදා රුසියානු මිලිටරි කොන්ත්‍රාත්කරුවන් මරා දැමීම හා සිරියාවේ තම හමුදාවන්ට තර්ජනය කරන්නේ නම් තමන් එකට එක කරන බව රුසියානු මිලිටරිය විසින් වොෂින්ටනයට අනතුරු ඇඟවීම සමග පිපිරී ඇති ආතතීන්වලට මග පාදමිනි.

ස්ක්‍රිපාල්ට විෂ වැද්දීම මත පෙල ගැස්වූ කෑ මොර ගැසීම,

ඔලිම්පික් මත්ද්‍රව්‍ය "සෝලියේ" සිට පෙල ගැසෙමින් එක්සත් ජනපද ජනාධිපතිවරනය තුල රුසියන් "ඇගිලි ගැසීම්" ගැන අවසානයක් නැති ප්‍රචාරය දක්වා වූ ප්‍රකෝපකරන මාලාවක කොටසකි. මේ සියල්ල සැලසුම් කෙරුනේ යුද්ධය සඳහා මහජනයා සූදානම් කිරීමට ය.

එක්සත් ජනපද ආන්ඩුව තුල මෙන් ම වොෂින්ටනය හා එහි දෘශ්‍යමාන යුරෝපීය මිතුරන් අතර මෙම ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ගැඹුරු බේද පවතී. ස්ක්‍රිපාල්ට විෂ වැද්දීම ආයුධයක් ලෙස සේවය කරන්නේ, රුසියාවට එරෙහිව වඩා ආක්‍රමනකාරී ප්‍රතිපත්තියක් සඳහා බල කරන වොෂින්ටනයේ හා ලන්ඩනයේ රාජ්‍ය තුල සංවිධානයවී සිටින අයට යි. එය අනෙකුත් යුරෝපීය බලවතුන්ට, විශේෂයෙන් ම ජර්මනියට පීඩනය යෙදීමේ මාධ්‍යයක් ද සපය යි. ජර්මනිය වඩ වඩා තමන්ගේ ම මහ බලවත් උත්සුකයන් හඹා යමින් සිටින අතර වොෂින්ටනයේ මූලෝපායික අරමුනු මෙන් ම එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන්ගේ ලාභ උත්සුකයන් හරස් කරමින් ගමන් කර ඇත.

ස්ක්‍රිපාල්ට විෂ වැද්දීම දැනුවත් රාජ්‍ය උද්ඝෝෂනයක කොටසක් බවට වඩාත් ම පැහැදිලි ඇඟවුමක් අඟහරුවාදා එළි දැක්වුනේ, එක්සත් ජනපද පාලන සංස්ථාපිතයේ හා එහි ඔත්තුසේවා ඒජන්සිවල දෘෂ්ටීන් හා ප්‍රචාරය සඳහා ප්‍රධාන හොරනෑ වන, *නිව් යෝක් ටයිම්ස්* හා *වොෂින්ටන් පෝස්ට්* පත්තරවල සැබවින් ම එකිනෙකට සමාන කතු වැකි පලවීමත් සමගිනි.

"බටහිර ආන්ඩු හා මැතිවරන අවුල් කරමින්, යුක්‍රේනය වැනි අසල්වැසියන් යටත් කරමින්, එමෙන් ම තහනම් රසායානික කාරකය යොදා ගනිමින් බටහිර නගරවල තම විරුද්ධවාදීන් ඝාතනය කිරීම" පිලිබඳව රුසියාවට චෝදනා කරමින් *පෝස්ට්* පත්‍රය අවධාරනය කලේ "පුටින් මහතා වැලක්විය යුතු ය. ඔහුගේ ඔත්තුකරුවන් දූසිම් කීපයක් පිටුවහල් කිරීම එක් පියවරකි, නමුත් එය ප්‍රමානවත් බව නො පෙනෙන" බව යි.

*ටයිම්ස්* පත්‍රය රුසියානු රාජ්‍යතාන්ත්‍රිකයින් පිටමං කිරීම පිලිගන්නා නමුත්, ඒ ආකාරයෙන් ම ප්‍රකාශ කරන්නේ "යුක්‍රේනය හා සිරියාවේ යුද්ධ ඉදිරියට තල්ලු කිරීමට ඇමරිකාව හා අනෙකුත් බටහිර රටවල මැතිවරනවලට මැදිහත්වීමේ සිට සියල්ල දුවවන පුටින් මහතාගේ මැරවරකම එලදායි ලෙස පසුපසට තල්ලු කිරීමට ට්‍රම්ප් මහතා ට තවත් ඉදිරියට යාමට සිදු වනු ඇති" බව යි.

*ටයිම්ස්* කතුවැකිය අත්වැල් බැඳ ගැනුනේ "එය සීතල යුද්ධය නො වේ, නමුත් රුසියාව සමග සම්බන්ධකම් අස්ථිර වෙයි" යන නමින් යුත් එහි ප්‍රවෘත්ති පිටුවේ නරුම ලිපියක් මගිනි. *ටයිම්ස්* ලිපිය ලියන ලද්දේ, "ඉරාකයේ ජනඝාතක අවි" පිලිබඳ බොරු ප්‍රචාරය කරන පත්තරයේ බොහෝ ලිපි ලියූ, ජුඩිත් මිලර් විසින් අපකීර්තියට පත් කෙරුනු "විමර්ශනාත්මක මාධ්‍යවේදී" ගුරුකුලයේ පලුවක් ද *ටයිම්ස්* පත්‍රයේ මොස්කව් වාර්තාකරු ද වන, ඇන්ඩෘ හිගින්ස් විසිනි.

සීඅයිඒ අනුග්‍රහ ලත් කුමන්ත්‍රනය ඉක්බිතිව නැගෙනහිර යුක්‍රේනයේ පැතිරුනු කියෙව් විරෝධි කැරැල්ල රුසියානු ඔත්තුකරුවන් හා විශේෂ හමුදා කන්ඩායම්වල සම්පූර්න වැඩක් බවට නියත ඡායාරූප සාක්ෂි ඉදිරිපත් කිරීමට අරමුනු කරමින් 2014 පල කෙරුනු *ටයිම්ස්* පත්‍රයේ මුල් පිටුවේ ලිපියේ ප්‍රධාන කතුවරයා වූයේ හිගින්ස් ය. ඊට පසු හෙලිදරව් වූයේ, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් *ටයිම්ස්* පත්‍රයට සපයන ලද "ඡායාරූප සාක්ෂි" මුලුමනින් ම ගොතන ලද ඒවා බව යි.

කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලත් හිගින්ස්, එක්සත් ජනපද ඔත්තුසේවා ක්‍රියාකාරීන් පුහුනු කිරීම සම්බන්ධයෙන් සුප්‍රසිද්ධ, වර්මොන්ට් හි මිඩිල්බරෝ විද්‍යාලයේ දී රුසියානු හා අරාබි භාෂා පිලිබඳ පශ්වාද්ගාමී අධ්‍යයනයක් ලබා ගැනීමට උත්සාහ කලේ ය. *ටයිම්ස්* පත්‍රය සඳහා වැඩ කිරීමට පෙර ඔහු *වොෂින්ටන් පෝස්ට්* පත්‍රයේ චීන වාර්තාකරු විය, ඔහුගේ ගමන් බඩු අතර ආන්ඩුවේ රහස්‍ය ලිපි සොයා ගැනීමෙන් පසු, ඔහු එරටින් නෙරපන ලදී. පිටමං කිරීම ආපසු හැරවීමේ තම උත්සාහයේ දී, *පෝස්ට්* පත්‍රය ඔහු වෙනුවෙන් බීජිනය පෙලඹවීමට හෙන්රි කීසිංගර් බඳවා ගත්තේ ය.

ස්ක්‍රිපාල් පලහිලව්ව ගැන හිගින්ස්ගේ ලිපියේ ප්‍රවාදය වන්නේ වොෂින්ටනය හා මොස්කව් අතර වර්තමාන ආතතීන් වැඩි වශයෙන් සමාන වන්නේ සීතල යුද්ධය අතරතුර පැවතුන ඒවාට නො ව, ඊට වෙනස් ව මතක් කර දෙන්නේ "1917 බෝල්ශෙවික් විප්ලවය පසු පස ආ අවිශ්වාසය අඩ පන කිරීමේ කාල පරිච්ජේදය"යි.

රුසියානු පාලක ධනේශ්වර කතිපයාධිකාරය නියෝජනය කරන පුටින් ආන්ඩුව, ගෝලීය විප්ලවය ප්‍රචාරය කරමින් නො සිටින බව පිලිගනිමින් හිගින්ස් සඳහන් කරන්නේ එය "සංස්ථාපිත සම්මතයන් හෙලා දැකීම මගින්, විදේශ ආන්ඩු අවඥාවට ලක් කරමින් සදොස් ලෙස ප්‍රීති වන" බව යි.(?)

යතාර්ථය නම් රුසියාව, එහි ප්‍රමානයේ මහත්වය හා යුරේසියානු භූස්කන්ධයේ කේන්ද්‍රයේ භූගෝලීය පිහිටීම මෙන් ම ලෝකයේ දෙවැනි විශාලත ම න්‍යෂ්ටික අවි ගබඩාවේ තම අයිතිය සමගින්, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ රාජ්‍යතාන්ත්‍රික බලයට බාධාවක් ලෙස නැගී සිටීම යි. " සංස්ථාපිත සම්මතයන්ට", උදා, එක්සත් ජනපද ගෝලීය ආධිපත්‍යයට බැඳී සිටීමට එය අසමත් වීම ඉවසිය නො හැක. "1920 ගන්වල මොස්කව් හි කඩාකප්පල්කාරී ක්‍රියා" සමග ගනුදෙනු කරන්නේ කෙසේ දැ යි බටහිර ජාතීන් දැන නො සිටි බව ලියමින්, ඔහු තව දුරටත් පවසන්නේ, "එදවස ප්‍රමුඛ බලවතා ද සෝවියට් සංගමය පිලි ගත් පලමු බටහිර රට ද වූ බ්‍රිතාන්‍ය සම්බන්ධයෙන් ගත් විට, එම ක්‍රියාදාමයට වර්තමානයේ දෝංකාරයන් තිබුනු" බව යි.

"1924දී බ්‍රිතාන්‍ය නව බෝල්ශෙවික් ආන්ඩුව" පිලිගත් අතර, ඊට පසු "ඔවුන් පැවසූ පරිදි පොලීසිය කැලඹීම් පැතිරවීමට අධිෂ්ඨාන සහගත සෝවියට් ඔත්තුකාර කවයක් සොයා ගත්" පසු සෝවියට් රාජ්‍යතාන්ත්‍රිකයන් පිටමං කලේ ය.

හිගින්ස්ගේ ඉතිහාසය පිලිබඳ බොහෝ වරනාත්මක අනුවාදයෙන් කුප්‍රකට "සිනෝවිව් ලිපිය" ඉවත් කෙරී ඇත, එවකට එම්අයි6 නමින් ප්‍රසිද්ධ වූ, බ්‍රිතාන්‍ය රහස් ඔත්තු සේවාව විසින් කූඨ රචනය කල එම ලිපිය, ඊට පසුව මිලිටරියට, කොන්සර්වටිව් පක්ෂයට හා දක්ෂිනාංශික මාධ්‍යයට සැපයුනි.

එවකට කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ විධායක කමිටු සභාපති වූ ග්‍රිගෝරි සිනොවියෙව්ගේ ලිපියක් ලෙස ඇගේ ගැසූ හොර ලිපිය මැතිවරනයට දින කීපයකට පෙර *ඩේලි මේල්* පත්‍රයට නිකුත් කෙරුනු අතර, එය මුල් පිටුවේ ප්‍රධාන ශීර්ෂපාඨයක මෙසේ මුද්‍රනය කෙරුනි: "සමාජවාදී අධිපතීන්ගේ සිවිල් යුද්ධ කුමන්ත්‍රනයක්: මොස්කව්ව අපගේ රත්තන්ට නියෝග කරයි: මහා කුමන්ත්‍රනයක් හෙලි වේ."

1924දී පලමු වරට බලයට පැමින තිබූ අතර සෝවියට් සංගමය පිලිගෙන තිබූ ලේබර් පක්ෂයට ව්‍යාජ ලිපිය මගින් ලැබුනු සම්මාදම වූයේ, අතු ගෑවී යන ලෙස ටොරීන්ට පරාජය වීමයි.

20වැනි සියවසේ ලොකු ම බ්‍රිතාන්‍ය දේශපාලනික සෝලිය වූ සිනෝවියෙව් ලිපිය යොදා ගැනුනේ මැතිවරනයක් පැරැද්දවීමට යි. හිගින්ස්, *ටයිම්ස්* හා සීඅයිඒ සංවිධානය තුල ඔවුන්ගේ "මූලාශ්‍රයන්' ප්‍රචාරනය කරමින් සිටින, ස්ක්‍රිපාල්ට විෂ වැද්දීම වටා වන කෙබරය යොදා ගනිමින් තිබෙන්නේ ලෝක යුද්ධයක් සූදානම් කිරීමට ය.

බිල් වෑන් ඕකන්

© www.wsws.org